# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1911/8 - 2015 අප්‍රේල් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සිංහලගේ ජගත් සමරවික්‍රම නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන වාසල මුදියන්සේලාගේ වල ගෙදර ජනක බණ්ඩාර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී ඉන්දික හතුරුසිංහ වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, වාසල මුදියන්සේලාගේ වල ගෙදර ජනක බණ්ඩාර මහතා දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඉන්දික හතුරුසිංහ,
තේරීම් භාර නිලධාරී,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව.

05 - 119

1A - G 21406 — 46 (2015/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන ලංකාපුර ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වන වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන අත්මඩලේ අලුත්වත්තේ ගෙදර මංජු ශ්‍රී අලුත්වත්ත අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ලංකාපුර ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුරවීර ආරච්චිගේ බන්දුල සමන්සිරි මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ලංකාපුර ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී ඉන්දික හතුරුසිංහ වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සුරවීර ආරච්චිගේ බන්දුල සමන්සිරි මහතා ලංකාපුර ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඉන්දික හතුරුසිංහ,
තේරීම් භාර නිලධාරී,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 22 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව.

05 - 120

---

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම**

**තලාව ප්‍රාදේශීය සභාව**

තලාව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන දිසානායක මුදියන්සේලාගේ සරත් දිසානායක මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අත හැර ඇති බව තලාව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම් භාර නිලධාරී,
තලාව ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 21 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

05 - 121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.